වෙළඳසැලකට ඇතුලු වී හිමිකරුට හසුවීමෙන් පසු සැකකරුවෙකු වෙළඳසැල තුළ දිවි තොර කරගත් සිදුවීමක් අරුණ සහ ලංකාදීප පුවත්පත් (10/04) වාර්තා කර තිබිණි.

1) මෙහි දිවි තොර කරගැනීමට තැත් කළ ආකාරය ඉදිරිපත් කර තිබිණි. පර්යේෂකයන් පවසනුයේ, දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යා හැකි බවයි. එසේ නම්, දිවි තොර කරගැනීමට තැත් කළ ආකාරය ඉදිරිපත් කිරීම ඔස්සේ අනුකරණාත්මක දිවි තොර කරගැනීම් සිදුවිය නොහැකි යැයි ඔබ සිතන්නේද?

2) මෙම පුවත් වාර්තාවන් හා උපකාරක අංක පළ කර නොමැත. දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවන් හා උපකාරක අංක පළ කර තිබුණේ නම්, දිවි තොර කරගැනීමේ යම් නැඹුරුතාවක් ඇති අයෙකුගේ ජීවිතය බේරාගැනීමේ අවකාශයක් ඉන් උදා නොවේ යැයි ඔබ සිතන්නේද?

එසේ නම්, දිවි තොර කරගැනීමක් මෙම පුවත්පත් මගින් ආවරණය කර ඇති ආකාරය සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

ඉහත දිවි තොර කරගැනීමේ සිදුවීම, මෙම පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ එදින වාර්තා වී නොතිබුණි.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf... https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf

**#MediaEthicsSL #lka #sinhalanews #Lankadeepa #Aruna**